සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

50 S I

## පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2020
## First Term Test - Grade 11 - 2020

නම/විභාග අංකය : ......................................... නාට්‍ය හා රංග කලාව - I කාලය : පැය 03යි.

වැදගත් :

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- **අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවලට (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.**

---

- **පහත දැක්වෙන පද්‍ය ඇසුරින් 01 - 05 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**

A. මල රජ වඩින දා - එක්ව වැදිකෙළි සමුදා
නික්ම කඩවර දා - ගොසින් මාඩවරේ සිටිදා

B. සැරයටිය අතකට - දවුල ලාගෙන උර පිට
ගත් ගන්වල ඇවිද - කරයි අණබෙර රාජ පනතට

C. පුරසඳ පායා දිලෙන වැනි මූණ තිගේ
දිලෙන වැනි මූණ තිගේ

D. සේරමානන් නරපති - මහනෙල් විලට බැසගති
කුසුම් සිඹ සැනසෙති - නෙලා කුසුමක් අතට අරගති

E. වතුර සොයන්නට ගුරුවා යනවා
ලබුකැට අරගෙන පිටත්ව යනවා
යන එන අයගෙන් පාර අසනවා
කුඹුකේ ළඟ එම ළිඳ පෙන්වනවා

(1) දික්තල කාලගෝල නාට්‍යයේ එන පද්‍යයක් වන්නේ,
1. A 2. B 3. C 4. D

(2) ගැමි නාට්‍ය දෙකකින් උපුටාගත් පද්‍යයන් වන්නේ,
1. B හා E 2. A හා C 3. A හා E 4. B හා D

(3) උඩරට ශාන්ති කර්මයන් නියෝජනය කරන පද්‍ය වන්නේ,
1. D 2. B 3. A 4. E

(4) සොකරි නාට්‍යයෙන් උපුටා ගත් පද්‍ය වන්නේ,
1. E 2. B 3. C 4. D

(5) පහතරට ශාන්ති කර්මයක් නියෝජනය කරන පද්‍ය වන්නේ,
1. A 2. B 3. C 4. D

NWP EXAM

- **අංක 06 සිට 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරන්න.**

(6) ප්‍රාසාංගික කලාවක් වන්නේ?
1. මුද්‍රා නාට්‍ය 2. සිනමාව 3. චිත්‍රපට 4. චිත්‍ර

(7) පොදුවේ වේදිකාව ආලෝක කිරීමට යොදාගනු ලබන්නේ,
1. යොමු පහන් 2. ඩිමරය 3. ධාරාලෝක පහන් 4. ස්පොට් ලයිට්

(8) යොමු පහනට භාවිත කරන වෙනත් නමක් වන්නේ,
1. තිත් පහන 2. ෆ්ලඩ් ලයිට් 3. ධාරාලෝක පහන් 4. වර්ණ චක්‍රය

(9) වේෂ භූෂණය අයත් වන්නේ,
1. ආහාර්ය අභිනයට 2. සාත්වික අභිනයට 3. ආංගික අභිනයට 4. වාචික අභිනයට

(10) චරිතාංග අංග රචනය යෙදිය යුතු චරිතයක් වන්නේ,
1. තල මල පිපිලා නාට්‍යයේ මහේෂිකා 2. මනමේ නාට්‍යයේ වැදි රජු
3. විකෘති නාට්‍යයේ ප්‍රියංගනී 4. නරි බෑණා නාට්‍යයේ ගම දූව

(11) අංග රචනය සඳහා යොදා ගන්නා උපකරණයකි.
1. ස්පොන්ච් 2. ක්‍රේප් හෙයාර් 3. නෝස් පොටි 4. ස්ප්‍රිට් ගම්

(12) නාට්‍යයකට සංගීතය අවශ්‍ය වන්නේ,
1. නාට්‍ය අලංකාර කර ගැනීම සඳහා ය. 2. ජවනිකා වෙනස්වීම ප්‍රේක්ෂකයන්ට දැන්වීමට ය.
3. සංවාද අතරතුර නිහඬ බව නැති කිරීමට ය. 4. සිදුවීම් හා අවස්ථා උද්දීපනය කිරීම සඳහා ය.

(13) වඩාත් ප්‍රකට රංග වින්‍යාසය කරුවෙකි.
1. ජෙරොම් ද සිල්වා. 2. ඉන්දු ධර්මසේන.
3. එදිරිවීර සරත්චන්ද්‍ර. 4. ජයලත් මනෝරත්න.

14) දෑස් අතර සබඳතාවය වර්ධනය කිරීම සඳහා යොදාගත හැකි රංග අභ්‍යාසයකි.
1. දර්පණ අභ්‍යාස. 2. ශිථිලකරණ අභ්‍යාස.
3. සංවේදන අභ්‍යාස. 4. මානසික අභ්‍යාස.

(15) නාට්‍ය නරඹන පුද්ගලයා හඳුන්වනු ලබන්නේ,
1. ශ්‍රාවකයා ලෙසිනි. 2. පාඨකයා ලෙසිනි.
3. සංනිවේදකයා ලෙසිනි. 4. ප්‍රේක්ෂකයා ලෙසිනි.

- **අංක 16 සිට 19 දක්වා ප්‍රශ්නවලට නොගැළපෙන පිළිතුර තෝරන්න.**

(16) නාට්‍යයක යොදාගනු ලබන පසුතල නිර්මාණ
1. සංකේතාත්මක අයුරින් යෙදිය හැක.
2. සැහැල්ලු ද්‍රව්‍ය යොදා නිමකළ යුතු ය.
3. පහසුවෙන් ගැලවීමට හා සවි කිරීමට හැකි විය යුතු ය.
4. සැබෑ ජීවිතයේ භාවිත වන ද්‍රව්‍යම යෙදිය යුතු ය.

(17) රංගාලෝකය
1. නාට්‍යයේ ශෛලිය ඉස්මතු කිරීමට යොදා ගතහැක.
2. අවස්ථාවන් තීව්‍ර කිරීම සඳහා යොදාගත හැක.
3. චරිත විශේෂකර දැක්වීමට යොදාගත හැක.
4. කාලය ඇඟවීම සඳහා යොදාගත හැක.

(18) නළුවෙකු තුළ තිබිය යුතු ගුණාංගයන් වන්නේ,
1. සුන්දර රූ සපුවක් තිබීම. 2. පරිකල්පන හැකියාව.
3. ඉවසීමේ ගුණය. 4. සාමූහික බව.

NWP EXAM

(19) රංග ක්‍රීඩාවල නිරතවීමෙන්,
1. සාමූහිකව කටයුතු කිරීමේ හැකියාව ලැබේ. 2. නිර්මාණාත්මක හැකියාව වර්ධනය වේ.
3. ක්‍රීඩා කෞශල්‍ය දියුණු වේ. 4. ඉවසීමේ ගුණය ප්‍රගුණ කළ හැකි ය.

- **අංක 20 සිට 24 දක්වා ප්‍රශ්නවලට පහත සඳහන් වගුව ඇසුරින් පිළිතුරු සපයන්න.**

| A | B | C | D |
|---|---|---|---|
| ගුරුවා<br>වෙදරාළ<br>පරයා | කුවේණි<br>රාහු<br>මලය රජු | ජසයා<br>මුදලි<br>ආරච්චි | සේරමාන රජු<br>පත්තිනි දේවි<br>පාළඟ කුමරු |

(20) කොහොඹා කංකාරිය ශාන්ති කර්මය හා සම්බන්ධ තොරතුරු අඩංගු වන්නේ,
1. B ය. 2. A ය. 3. D ය. 4. C ය.

(21) මේ දෙවොල් මඩුවේ හා පහන් මඩුවේ පුරාවෘත්තවල එන චරිතයි.
1. A ය. 2. B ය. 3. C ය. 4. D ය.

(22) 'C' අක්ෂරයේ ඇතුළත් චරිත දක්නට ලැබෙන්නේ.
1. සොකරි නාට්‍යයේ. 2. කෝලම් නාට්‍යයේ.
3. දික්තල කාලගෝල නාට්‍යයේ. 4. කොහොඹා කංකාරියේ.

(23) ඉහත සඳහන් තොරතුරුවල රඟ නොදක්වෙන චරිත ඇතුළත් අක්ෂර වන්නේ
1. A හා B 2. B හා C 3. A හා D 4. B හා D

(24) A අක්ෂරය තුළ ඇතුළත් චරිත දක්නට ලැබෙන්නේ,
1. නාඩගම්වල 2. කෝලම්වල 3. සොකරිවල 4. නූර්තිවල

- **නිවැරදි පිළිතුර තෝරන්න.**

(25) රංග ක්‍රීඩා ඇතුළත් පිළිතුර වන්නේ,
1. ගස් දෙකේ ක්‍රීඩාව, මීයෝ පූසෝ, අත්තල ක්‍රීඩාව.
2. මීයෝ පූසෝ, අත්තල ක්‍රීඩාව, හිමකන්ද දියවීම.
3. මකර වලිගය, අත්තල ක්‍රීඩාව, බැලූනයට හුළං ගැසීම.
4. හිම කන්ද දිය වීම, රාක්ෂයෙක් ගමට ඇවිල්ලා, මීයෝ පූසෝ.

(26) මේවා දික්තල කාලගෝල නාට්‍යයේ එන චරිත වේ.
1. කාලගෝල, දික්තලා, හේතු 2. කාලගෝල, දික්තලා, චත්තු දන්ත
3. කාලගෝල, දික්පිටියා, කිරිබිංදු 4. කාලගෝල, චත්තු දත්ත, දීග ජන්තු

(27) ගැට බෙරය වාදනය කරන ගැමි නාටකය වන්නේ,
1. සොකරි. 2. කෝලම්. 3. නාඩගම්. 4. කවි නාඩගම්.

(28) දෙවොල් මඩු ශාන්ති කර්මයට අයත් නොවන නාට්‍යමය පෙළපාලියක් වන්නේ,
1. අඹ විදමන. 2. මරා ඉපැද්දවීම. 3. රාමා මැරීම. 4. ගුරුගේ මාලාව.

(29) පහත දැක්වෙන්නේ කෝලම් නාටකය පැතිරී ඇති ප්‍රදේශයයි.
1. ගාල්ල, මාතර, මිරිස්ස 2. ගාල්ල, අම්බලන්ගොඩ, කළුන්දෑව
3. මාතර අම්බලන්ගොඩ, නිවිතිගල 4. ගාල්ල, කිත්තඩුව, රත්නපුර

(30) ශරීරාංග සැහැල්ලු කිරීම සඳහා උපකාරී වන රංග අභ්‍යාස වන්නේ,
1. සංවේදන අභ්‍යාස. 2. ශිථිලකරණ අභ්‍යාස. 3. ස්වසන අභ්‍යාස. 4. තාපන අභ්‍යාස.

NWP EXAM

- **පහත දැක්වෙන මුහුණු ඇසුරින් අංක 31 සිට 32 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

**A**



**B**



(31) A හා B වෙස්මුහුණු අනුපිළිවෙලින්
1. ජස හා ආරච්චි 2. හේවා හා ආරච්චි 3. ජස හා අණබෙර 4. ජස හා මුදලි

(32) ඉහත A වෙස් මුහුණ පළඳින චරිතයෙහි රාජකාරිය වන්නේ,
1. පණිවිඩ දීම. 2. රාජ භෝජන සැකසීම.
3. අණබෙර ගැසීම. 4. රාජ සළු පිළි සේදීම.

- **නිවැරදි පිළිතුර තෝරන්න.**

(33) දික්තල කාලගෝල නාට්‍යයේ දික්තලාගේ චරිතය රඟපාන ශිල්පිණියන් දෙදෙනා වන්නේ,
1. මැණිකේ අත්තනායක, මාදනී මල් වත්ත 2. මැණිකේ අත්තනායක, රත්නා ලාලනී
3. මාදනී මල් වත්ත, ට්‍රිලීෂියා ගුණවර්ධන 4. මැණිකේ අත්තනායක, කුමාරි මැණිකේ

(34) ''තානායම් පොළ'' රංග භූමිය ලෙස භාවිත කරන ලද්දේ,
1. සොකරි. 2. කෝලම්. 3. නාඩගම්. 4. නූර්ති.

(35) නාට්‍ය පෙළක රංග විධාන අවශ්‍ය වන්නේ,
1. නළු නිළියන්ට. 2. ප්‍රේක්ෂකයන්ට. 3. අධ්‍යක්ෂකට. 4. වේෂ නිරූපන ශිල්පීන්ට.

(36) සංගීතයට මුල්තැන හිමිවන නාට්‍ය විශේෂය වන්නේ
1. ලෝක ධර්මී නාට්‍ය. 2. ස්වභාවික නාට්‍ය.
3. ගැමි නාට්‍ය. 4. නාට්‍ය ධර්මී නාට්‍ය.

(37) පහත දැක්වෙනුයේ කොහොඹා කංකාරි ශාන්ති කර්මයේ උපන් කතාවේ එන චරිතයි.
1. විජය රජු, කුවේණි, රාහු. 2. රාවණ රජු, කුවේණි, පත්තිනි.
3. විජය රජු, කුවේණි, පත්තිනි. 4. විජය රජු, රාහු, පත්තිනි.

(38) ''දික් සුරඹී'' යනු කාලගෝල නාට්‍යයේ,
1. දික් පිටියාගේ මවයි. 2. දික්තලාගේ මවයි.
3. කාලගෝලගේ මවයි. 4. දික්තලාට කියන වෙනත් නමකි.

(39) පත්තිනි පූජාව මුල්කරගත් ගැමිනාටකය වන්නේ,
1. කෝලම් 2. නාඩගම් 3. නූර්ති 4. සොකරි

(40) නාට්‍ය හා රංග කලාව විෂය ඉගෙනීම තුළින්
1. දක්ෂ නළුවන් බිහි වේ. 2. වින්දන ශක්තිය දියුණු වේ.
3. රංගන ශිල්පීන් බිහි වේ. 4. උසස් අධ්‍යාපනයට මඟ සැලසේ.

NWP EXAM

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

50 | S | II

# පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2020

# First Term Test - Grade 11 - 2020

**නම/විභාග අංකය : ....................................... නාට්‍ය හා රංග කලාව - II**

වැදගත් :

- **පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු ලියන්න.**

---

- **දික්තල කාලගෝල නාට්‍ය පෙළ ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01. (i) දික්තල කාලගෝල නාට්‍යයේ මුල් පිටපත කාගේ නිර්මාණයක් ද? (ලකුණු 02)
(ii) දික්තල කාලගෝල නාට්‍යයේ පූර්ව රංගයේ එන චරිතයක් නම් කරන්න. (ලකුණු 02)
(iii) දික්තල කාලගෝල නාට්‍ය අවසානයේ දී ගයන ආශිර්වාදාත්මක ගීය හඳුන්වන්නේ කුමන නමකින් ද? (ලකුණු 02)
(iv) ''පොත පතේ මිස කුස පබාවතීලා අප අතර කොයින් ද?........'' යනුවෙන් පවසන්නේ කවු ද? කාහට ද? (ලකුණු 02)
(v) දික්තල කාලගෝල නාට්‍යයේ දික්තලාගේ චරිතයට පණ පොවන නිළියන් දෙදෙනා නම් කරන්න. (ලකුණු 02)
(vi) දික්තල කාලගෝල නාට්‍යය සඳහා ආභාෂය ලබාගෙන ඇති ජන නාටක සම්ප්‍රදාය කුමක් ද? (ලකුණු 02)

02. (i) ප්‍රාසාංගික කලා හතරක් නම් කරන්න. (ලකුණු 02)
(ii) ඒ අතරින් දෙකක් විස්තර කරන්න. (ලකුණු 04)
(iii) ප්‍රාසාංගික කලා අතරින් නාට්‍ය කලාවේ සුවිශේෂතාව විස්තර කරන්න. (ලකුණු 06)

03. (i) 'රංගාලෝකය' යන්න පැහැදිලි කරන්න. (ලකුණු 02)
(ii) විශේෂ රංගාලෝක උපකරණ දෙකක් නම් කරන්න. (ලකුණු 04)
(iii) අතීතයේ දී රංගාලෝකය ලබාගත් අයුරු විස්තර කර දක්වන්න. (ලකුණු 06)

04. (i) අංග රචනය යනු කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 02)
(ii) අංග රචනයේ ප්‍රභේද කීය ද? (ලකුණු 04)
(iii) චරිතයක් අංග රචනය කිරීමේ දී සැලකිය යුතු කරුණු මොනවාදැයි විස්තර කරන්න. (ලකුණු 06)

05. (i) උඩරට සම්ප්‍රදාය නියෝජනය කරන ප්‍රධාන ශාන්ති කර්මය නම් කරන්න. ලකුණු 02)
(ii) එම ශාන්ති කර්මයේ අන්තර්ගත නාට්‍යමය පෙළපාලි හතර නම් කරන්න. (ලකුණු 04)
(iii) එයින් එක් නාට්‍යමය පෙළපාලියක් ගෙන එහි අඩංගු වන නාට්‍යමය ලක්ෂණ පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණ 06)

06. (i) කෝලම් ගැමි නාටකය පැතිරී ඇති ප්‍රදේශ දෙකක් ලියන්න. (ලකුණු 02)
(ii) කෝලම් රංග භූමිය ඇඳ කොටස් නම් කරන්න. (ලකුණු 04)
(iii) කෝලම් නාට්‍යයේ රංග ශෛලිය පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 06)

07. පහත සඳහන් කථා සැකිල්ල පාදක කර ගනිමින් චරිත, සංවාද, රංග විධාන සහිත නාට්‍ය පිටපතක් රචනා කරන්න.

මෙවර පැවැත්වෙන නිවාසාන්තර ක්‍රීඩා උත්සවයේ මැරතන් තරගය ජය ගැනීමට බලාපොරොත්තු වන විදූෂ අළුයම අවදි ව මඳ අඳුරේ ගම වටේ දුවයි. පුහුණුවීම් අවසන් දිනයේ දෙමාපියන්ගේ අකමැත්ත පිට පාරට පැමිණ ටික දුරක් ධාවනයේ යෙදෙන විට.......

(i) සංවාද, රංග විධාන සහිත පිටපත රචනයට (ලකුණු 04)
(ii) ගැටුම් අවස්ථා නිර්මාණයට (ලකුණු 04)
(iii) නාට්‍යෝචිත අවස්ථා නිර්මාණයට (ලකුණු 04)

NWP EXAM